
# යාළුවන්ට අලුත් තැනක කෑම



යශාලි දිසානායක

# යාළුවන්ට අලුත් තැනක කෑම

යශාලි දිසානායක

5 වසර A

ISBN-978 -624-2111-101-8

මහ/මහාමායා විදුහල

මහනුවර

## පිදුම

මට අකුරු කර සියළුම ගුරුතුමියන්ලා වෙත පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්ස් වැඩමකර වූ හේමමාලා කුමාරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී,අභයකෝන් .එස්.
ආණ්ඩුකාරවර.ම පළාතමධ්‍ය,
සම්මානිත මහාචාර්ය .ලයපේරාදෙණිය විශ්වවිද්‍යා ,
2026-05-10

# <u>සුභාශිංසන පණිවුඩය</u>

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටීඑවන් පසුබිමක සුසමාහිත වූ සමබර . පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ දළදා සමිඳු සරණින් හේමමාලා ශ්‍රී . පෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි න්ථකරණ ව්‍යාඋපහාර ග්‍ර .ර්ථනා කරමීමම ප්‍රා

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ලේන් පැටියෙක් කෑම හොයාගෙන අපේ ගෙදරට එන්න පටන් ගත්තා. එයා නිතරම ආවා කෑම කන්න. ඒ අතර දවසක්, පූසා අපිට හොරෙන් ලේන් පැටියා අල්ලන්න ගියා.




ඒ වුනාට මම නම් පූසාට ලේන් පැටියාව අල්ලන්න ඉඩ දුන්නේ නෑ. මම ඉක්මනට පූසා එලවලා දැම්මා. ඊට පස්සේ මේ වැඩේ හරියන්නේ නැති හින්දා මම අම්මයි අප්පච්චියි එක්ක කතා වුණා ලේනාට කෑම දෙන්න පූසාට එන්න බැරි තැනක් හදන්න. අපි මේ ගැන කතා කර කර ඉද්දී අයියාට ඇහිලා අයියා  පහල ඉඳන් උඩට ඇවිල්ලා කිව්වා නෙල්ලි ගහේ ඉඳන් බැම්මට යනකල් ලීයක් දාලා හදමු කියලා.



ඒ අදහසින් පස්සේ තමයි අපි උණ බටයක් දාලා යාළුවොන්ට කෑම දෙන්න තැනක් හැදුවේ. අලුත් කෑම ලෑල්ල හදලා දවස් දෙක තුනක් යනකල් කවුරුත්ම කෑම කන්න ආවේ නෑ.



ඉතින් ඊළඟ දවසේ උදේමත් මම අම්මාගෙන් කෑම ඉල්ලගෙන කෑම ලෑල්ලට කෑම දැම්මා. කවුරු හරි යාළුවෙක් කෑම කන්න කෑම ලෑල්ලට එයි කියලා මම බලාගෙන හිටියා.





උදේම බත් දාලා බලා හිටියා යාළුවෙක් එයි කියලා. අනේ කොහොම හරි දෙමලිච්චෝ ජෝඩුවක්ම ආවා. ලේනුත් ඇවිල්ලා දඟල දඟල කාලා යනවා. මම හොරෙන් බලාගෙන හිටියා. අද නම් හරිම සතුටු දවසක් මට.



කවුරු නැතත් ලේනා නම් අනිවාර්යෙන් දැන් බත් කන්න එනවා. අපි එළියේ ඉන්නවා දැක්කොත් අනික් කුරුල්ලෝ නම් යනවා. ඒත් ලේනා නම් බය නෑ. ලේනා ඉතින් කොහොමත් හැමදාම එන යාළුවනේ.

අද කෑදැත්තන් දෙදෙනෙකුත් ඇවිල්ලා බත් කෑවා. හැබැයි කෑවාට වඩා හොටේ වද්දලා බත් ටික හලා ගත්තා. එයාලා ගියහම ආයෙත් බත් දැම්මා මොකද අනිත් යාලුවොන්ට බඩගින්නේ ඉන්න වෙන නිසා.



ඒ විතරක් නෙමේ දැන් කොණ්ඩ කුරුල්ලොත් බත් කන්න එනවා සමහර දවසට, මම අද තමයි දැක්කේ කාලා යන්න යද්දී.




ලේනා උදේම ඇවිත් නෙල්ලි ගහේ ඉඳන් බත්
දානකන් බලන් ඉන්නවා. මම දැක්කා මම
අම්මාගෙන් බත් ඉල්ලද්දී මෙන්න ලේනා කෑ
ගහනවා. මම ඉක්මණින් බත් දැම්මා. ගිරවෙකුත්
ආවා බත් කන්න දැන් ඉස්සර වගේ නෙවේ. අපේ
අලුත් ලෑල්ල නිසා අපිට කෑම කන්න එන
යාළුවොන්ව නිතර බලාගන්න පුළුවන්.



ලේන්නු දෙන්නෙක්ම උදේ මම ඉස්කෝලේ යන්න කලින් ඇවිත් බත් කනවා. එක ලේනෙක් බත් කකා ඉඳලා අනිත් ලේනා බත් කන්න එද්දි උෟව පන්නනවා. නෙල්ලි ගහේ ඉඳන් කාමරංකා ගහට යනකල්ම.



මට හරිම සතුටුයි මෙහෙම අපි කෑම දාන්න තැනක් හදපු එක ගැන. දැන් ලේනා විතරක් නෙවේනේ කොච්චර යාලුවෝ ගොඩක් එනවද කෑම කන්න.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාලස නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින සහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් 'හේමමාලා උපහාර' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)